# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,818 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාදා — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 15/61.

**තැපැල් කාර්යාල ආඥාපනත**

1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ප්‍රකාශනයෙන් හා 1948 ජූලි මස 28 වෙනි දින අංක 9,889 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ප්‍රකාශනයෙන් වෙනස් කරනු ලැබූ තැපැල් කාර්යාල ආඥාපනතේ (190 වෙනි අධිකාරය) 25(1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන හා වැඩ ඇමති, ඉඩම්පිටියෙ රාල්ලාගේ පුංචි බණ්ඩා ගුණතිලක කලුගල්ල වන මම, අගමැති හා ආරක්ෂක හා විදේශ කටයුතු ඇමතිගේ එකඟත්වය ඇතිව, 1961 අංක 9 දරණ හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 23 වෙනි නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ කරනු ලැබූ ආඥාවක් අනුව රඳවා ගනු ලැබූ යම් තැනැත්තකුට ලිපිනයෙන් යොමු කරනු ලැබූ සියලු තැපැල් භාණ්ඩ මා විසින් නියම කරනු ලබන ආකාරයට සුදුස්සක් කිරීම සඳහා පොලිස්පති වෙත හෝ පොලිස්පති විසින් නම් කරනු ලබන සහකාර සුපිරින්ටෙන්ඩන්ට් කෙනෙකුගේ තත්ත්වයට වඩා පහත් තත්ත්වයක නොවන යම් පොලිස් නිලධරයකු වෙත බාර දිය යුතු බවට මේ ආඥාව මගින් නියම කරමි.

පී. බී. ජී. කලුගල්ල,
ප්‍රවාහන හා වැඩ ඇමති.

1961 දෙසැම්බර් 9,
කොළඹ.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2295—ජේ. ඇන්. ආර් 266—7,020 (61/12)